ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය
இலங்கை தேசிய கூட்டுறவுச் சபை
NATIONAL CO-OPERATIVE COUNCIL OF SRI LANKA
Affiliated to the International Co-operative Alliance

National Co-operative Council of Sri Lanka
Reg.No: කො2490-1972.07.26

International Co-operative Alliance Asia & Pacific
Co-operative Enterprises Build a Better World

මගේ අංකය / எமது இல. / My No. : එන්සිසි/අපු/නිපා/උපෙ/01
ඔබේ අංකය / உமது இல. / Your No. :
දිනය / திகதி / Date : 2021 මැයි 25

සියලුම මුදුන් මට්ටමේ සමුපකාර සමිති සංගම් වල,

සහ සියලුම විවිධ සේවා / සණස / අනෙකුත් සමුපකාර සමිති වල,

සාමාන්‍යාධිකාරී මහත්ම / මහත්මීන් වෙත,

**සමුපකාර සංවර්ධන සහතික පත්‍ර උසස් පෙළ පාඨමාලාව - 2021/2022 ( මාර්ගගත )**
**( තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාවේ අනුමත පුහුණු පාඨමාලාවකි )**

ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය විසින් පවත්වනු ලබන සමුපකාර සංවර්ධන සහතික පත්‍ර උසස් පෙළ පාඨමාලාව 2021/2022 (මාර්ගගත) සඳහා පුහුණු ලාභීන් බඳවා ගැනීමට අයදුම්පත් කැඳවන බව කාරුණිකව දන්වමි.

මෙම පාඨමාලාව හැදෑරීම සමුපකාර ක්ෂේත්‍රයේ නියුතු වුවනට සිය වෘත්තිමයභාවය ඉහල නංවා ගැනීමටත්, සමුපකාර සේවකයන් සඳහා උසස්වීම් හා ඉහල තනතුරු සඳහා අයදුම්කිරීමේදි සුදුසුකමක් ලෙසත්, සමුපකාර සේවක කොමිෂන් සභාව පිළිගෙන ඇත.

මෙම මාර්ගගත උසස් පෙළ පාඨමාලාවේ විෂයය ඉගැන්වීම් කටයුතු Zoom ඔස්සේ පැවැත්වෙන අතර, ඒ සම්බන්ධව පාඨමාලාවට පාඨමාලාලාභීන් ලියාපදිංචි කිරීමට පෙර තොරාගත් අයදුම්කරුවන් අදාල කළාපීය පුහුණු මධ්‍යස්ථානයන්හිදි Zoom භාවිතා කිරීම පිළිබඳ පුහුණු කර අදාල තාක්ෂණික දැනුම ප්‍රායෝගිකව භාවිතා කිරීමට අවශ්‍ය මග පෙන්වීම සිදු කරනු ලැබේ. එසේම අවස්ථානුකූලව පුහුණුලාභීන් වෙත ප්‍රායෝගික දේශන / සම්මන්ත්‍රණ සඳහා සහභාගිවීමට අවස්ථාව ලබාදීමට සැළසුම් කර ඇත,

පාඨමාලාව හැදෑරීම සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් සහ අදාළ අයදුම්පත්‍රය මේ සමග යොමු කර ඇත. ඒ අනුව අදාළ මූලික සුදුසකම් සපුරා ඇති මෙම පාඨමාලාව හැදෑරීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් මෙම අයදුම්පත්‍රය සම්පූර්ණ කර 2021 - 06 - 30 දිනට පෙර අප වෙත ලැබීමට සලස්වන මෙන් වැඩිදුරටත් කාරුණිකව ඉල්ලා සිටිමි.

ප්‍රධාන විධායක නිලධාරී

පිටපත්

01 ගරු සභාපති තුමා - ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය ( කාරුණික දැන ගැනීම සඳහා )

02 සමුපකාර සංවර්ධන කොමසාරිස් / සමිති රෙජිස්ට්‍රාර් තුමා - සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව ( කාරුණික දැන ගැනීම සඳහා )

03 ලේකම් තුමිය - සමුපකාර සේවක කොමිෂන් සභාව ( කාරුණික දැන ගැනීම සඳහා )

National Co-operative Council of Sri Lanka

# සමුපකාර සංවර්ධන සහතික පත්‍ර උසස් පෙළ පාඨමාලාව 2021 / 2022 ( මාර්ගගත )
## ( තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අනුමත පුහුණු පාඨමාලාවකි )

## විස්තර පත්‍රිකාව

**01. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය** — 2021 ජුනි 30

**02. ඉල්ලුම් පත්‍ර** — මේ සමඟ අමුණා ඇති ආකෘතියට අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2021 ජුනි 30 දිනට පෙර එවිය යුතුය.

**03. ඉල්ලුම් පත්‍ර එවිය යුතු ලිපිනය** —
**ප්‍රධාන විධායක නිලධාරී**
**ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය**
**අංක 455, සමුපකාර මන්දිරය,**
**ගාලු පාර, කොළඹ 03.**
හෝ
**ncceducationsrilanka@gmail.com**

**04. පාඨමාලා ගාස්තු සහ විභාග ගාස්තු** — රු.24000/- කි. මෙය මුදලින් හෝ "ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය" නමින් ලියූ චෙක්පතකින් පාඨමාලාව ආරම්භ කරන දිනයේදී ගෙවිය යුතුය.

**05. පාඨමාලා කාලය** — වසර එකකි.

**06. පුහුණුවේ ප්‍රතිලාභ** :

1. මෙම පාඨමාලාව හැදෑරීමෙන් පසු සමුපකාර සමිතිවල සේවය කිරීම සඳහා අවශ්‍ය නව දැනුම හා කුසලතා වර්ධනය වීම.
2. ඉහල තනතුරු වලට උසස් වීම් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරාලීමට අවශ්‍ය වීම.
3. බාහිර පුද්ගලයන්ට සමුපකාර ව්‍යාපාරයේ රැකියා අවස්ථා උදාකරගත හැකිවීම.
4. පාඨමාලාව අවසානයේ පවත්වන විභාගයේදී පළමු පෙළ හෝ දෙවන පෙළ සමාර්ථයක් ලබමින් වැඩිම ලකුණු ලබාගන්නා එක් පුහුණුලාභියෙකුට විදේශ චාරිකාවක් සඳහා අවස්ථාවක් ලැබීම.

**07. විෂයයන්**

| පළමු අදියර | දෙවන අදියර |
|---|---|
| 1. සමුපකාරය | 6. ගණකාධිකරණය II |
| 2. සාමාජික හා මහජන සම්බන්ධතාවය | 7. මානව සම්පත් කළමනාකරණය |
| 3. ලේකම් පරිචය | 8. නීතිය හා පරිචය |
| 4. අලෙවි කළමනාකරණය | 9. මූල්‍ය කළමනාකරණය |
| 5. ගණකාධිකරණය I | 10. තොරතුරු තාක්‍ෂණය |
| | 11. ක්ෂේත්‍ර නිබන්ධනය |

**08.** මෙම මාර්ගගත උසස් පෙළ පාඨමාලාවේ විෂයය ඉගැන්වීම් කටයුතු Zoom ඔස්සේ පැවැත්වෙන අතර, ඒ සම්බන්ධව පාඨමාලාවට පාඨමාලාලාභීන් ලියාපදිංචි කිරීමට පෙර තොරාගත් අයදුම්කරුවන් අදාල කළාපීය පුහුණු මධ්‍යස්ථානයන්හිදී Zoom භාවිතා කිරීම පිළිබඳ පුහුණු කර අදාල තාක්ෂණික දැනුම ප්‍රායෝගිකව

භාවිතා කිරීමට අවශ්‍ය මග පෙන්වීම සිදු කරනු ලැබේ. පළමු අදියර විෂයයන් 05ක් වන අතර දෙවන අදියර යටතේ විෂයයන් 05ක් වේ. එක් එක් අදියර අවසානයේ ඊට අදාල විභාගය අපගේ කළාපීය පුහුණු මධ්‍යස්ථානවලදී පමණක් පැවැත්වේ. මාර්ගගත ක්‍රමයට මෙම පාඨමාලාව පැවැත්වෙන අතර අදාල විෂයය පාඩම් සටහන් පළමුව පාඨමාලාලාභීන් වෙත වට්ස් ඇප් (WhatsApp) හරහා ලබා දෙන අතර අදාල විෂයය දේශන එක් මසකට එක් විෂයකට අදාලව දින 05ක් අපගේ උසස් පෙළ කාලසටහන් වලට සමගාමීව Zoom ඔස්සේ පන්ති පැවැත්වේ. එක් එක් විෂයයට අදාලව අභ්‍යාස හා පැවරුම් ද වේ.

අපගේ උසස් පෙළ කාලසටහන් වලට සමගාමීව එක් මසකදී එක් විෂයයකට අදාල විෂයය දේශන Zoom ඔස්සේ අධ්‍යයනය කර අවසන් වූ පසු පාඩම් සටහන් පරිශීලනය කර පැවරුම් අභ්‍යාස සිදු කල යුතුය. එම පැවරුම් පාඨමාලාලාභියා ලියාපදිංචි වන කළාපීය මධ්‍යස්ථානය වෙත පැමිණ හෝ තැපැල් මාර්ගිකව භාර දිය යුතුය. පළමු අදියරට අදාල විෂයය දේශන කටයුතු අවසන් වූ පසු ලියාපදිංචි වූ කළාපීය පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත්වෙන විෂයය ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණයට ( මෙය Zoom ඔස්සේ නොව මධ්‍යස්ථානයට පැමිණ සම්මන්ත්‍රණයට ) සහභාගි විය යුතුය. එසේ සහභාගි වීමෙන් පසු පළමු අදියර විභාගය පැවැත්වෙන අතර ඉන් පසු පළමු අදියර පැවැත් වූ ආකාරයෙන්ම දෙවන අදියර අධ්‍යයන කටයුතු ආරම්භ කරනු ලබන අතර එම විෂයයන්හි Zoom ඔස්සේ දේශන කටයුතු අවසන් වූ පසු නැවත දෙවන අදියරට අදාල විෂයය ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණයන් පැවැත්වෙන අතර ඉන් පසු දෙවන අදියර විභාගය පැවැත්වේ.

**09.** මෙම විෂයයන්ට අමතරව දෙවන අදියරේ මූල්‍යය කළමනාකරණය විෂයය අධ්‍යයන කටයුතු අවසන් වී දින 30 ක් ඇතුළතදී තමා ලබාගත් විෂයය දැනුම පදනම් කර ගනිමින් තමා සේවය කරන සමිතියේ හෝ සමුපකාර ව්‍යාපාරයට පොදුවේ බලපාන ගැටලුවක් විසඳීම සඳහා ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය විසින් නියමකරන ලද පාඨමාලාවේ මාතෘකාව යටතේ ක්ෂේත්‍ර නිබන්ධනයක් සකසා ඉන් පිටපතක් අපේක්ෂකයා පුහුණුව ලබන කලාපීය මධ්‍යස්ථානයට ලබාදිය යුතුය. මෙය අනිවාර්ය විෂයයක් ලෙස සැළකෙන අතර ඒ සඳහා ප්‍රමාණවත් කුසලතාවයක් නොදැක්වුවහොත් හෝ අදාල නිබන්ධනය නියමිත දින 30 ට පෙර භාරදීමට අපොහොසත් වුවහොත් විභාග ප්‍රතිඵල අත්හිටුවනු ලැබේ. ක්ෂේත්‍ර නිබන්ධනය ඇගයීමේදී එම ව්‍යාපෘතිය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේ හැකියාව ද ඇගයීමට ලක් කෙරේ.

පළමු වර විභාගයට පෙනී සිට අසමත් වූ හා ඌන සමත් වූ අපේක්ෂකයින් නැවත එළඹෙන ඊලඟ වසර දෙක ඇතුළත නැවත පෙනී සිටීමෙන් විභාගය සම්පූර්ණ කර ගත යුතු වේ. ඊට පසු නැවත විභාගයට පෙනී සිටින්නේ නම් නවක පුහුණුලාභියෙකු ලෙස නැවත ලියාපදිංචි වී පන්ති වාර සඳහා සහභාගි විය යුතුය.

**10. ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ සහ විභාග පැවැත්වෙන අපගේ කළාපීය සමුපකාර පුහුණු මධ්‍යස්ථාන**

| | | |
|---|---|---|
| කොළඹ | : | ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය, 455, ගාලු පාර කොළඹ 3. |
| විදුහල්පති | | 011 2 585496 / 071 6 335 120 |
| ගාල්ල | : | සමුපකාර සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය, 147, පෙට්ටිගලවත්ත, ගාල්ල. |
| විදුහල්පති | | 091 3 920955 / 076 6 522 641 |
| කහගොල්ල | : | සමුපකාර සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය, කහගොල්ල, දියතලාව. |
| ස්ථානභාර නිලධාරි | | 057 2 223062 / 071 8 658 916 |
| කුරුණෑගල | : | සමුපකාර සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය, 150, නුවර පාර, කුරුණෑගල. |
| විදුහල්පති | | 037 2 223687 / 071 2 149 600 |
| අනුරාධපුරය | : | සමුපකාර සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය, 519/15, ජයන්ති මාවත, අනුරාධපුරය. |
| විදුහල්පති | | 025 2 235559 / 071 6 972 895 |

**11. සුදුසුකම්**

**(අ) සමුපකාර සේවකයන් සඳහා**

11.1 සමුපකාර සංවර්ධන සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) පාඨමාලාව, සමුපකාර සේවක සහතික පත්‍ර පාඨමාලාව හෝ අධීක්ෂණ මට්ටමේ පදනම් පාඨමාලාව සමත්ව අවුරුදු 02 ක අඛණ්ඩ සේවයක් ලබා තිබීම හෝ

11.2 ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලයට පිළිගත හැකි වෙනත් සහතික

11.3 නියමිත සුදුසුකම් සහිතව බඳවා ගනු ලැබූ අවුරුදු තුනක අඛණ්ඩ සේවයක් සහිත කළමනාකරණ හෝ අධීක්ෂණ මට්ටමේ නිළධාරීන්

11.4. මධ්‍යම සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 2016/01 චක්‍රලේඛය අනුව II පන්තියේ කළමනාකරණ සහකාරවරුන් (ලිපිකරු)

**(ආ) බාහිර අයදුම්කරුවන් සඳහා**

11.5 ජාතික පොදු සහතික පත්‍ර විභාගය හෝ අ.පො.ස විභාගයෙන්, අංක ගණිතය, ගණිතය, වාණිජ අංක ගණිතය, ගණකාධිකරණය, වාණිජ්‍ය යන විෂයයන් ගෙන් එකක් ඇතුලුව සම්මාන 04 ක් සහිතව විභාගය සමත්වීම හා අ.පො.ස. (උ.පෙළ) විභාගය සමත්වීම, හෝ

11.6 ජාතික පොදු සහතික පත්‍ර විභාගය හෝ අ.පො.ස (සා.පෙළ) විභාගයෙන්, අංක ගණිතය, ගණිතය, වාණිජ අංක ගණිතය, ගණකාධිකරණය, වාණිජ්‍ය යන විෂයයන් ගෙන් එකක් ඇතුලුව සම්මාන 04 ක් සහිතව විභාගය සමත්වීම හා පිළිගත් ආයතනයක හෝ රජයේ කාර්මික විද්‍යාලයක ඉහළ විභාගයක් සමත්වී තිබීම හෝ,

11.7 වෙනත් පිළිගත් විභාගයක් සමත්වී තිබීම

**වෙනත් කරුණු :**

අසම්පූර්ණ ඉල්ලුම් පත්‍ර හා ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන කරුණු වැරදි බව අනාවරණය වුවහොත් ඔබගේ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබේ. පුහුණුවට තෝරා ගැනීම සඳහා පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් තිබෙන අපේක්ෂකයින් පමණක් කැඳවනු ලැබේ. ඒ සඳහා ගමන් වියදම් හෝ වෙනත් කිසිම දීමනාවක් ගෙවනු නොලැබේ.

ප්‍රධාන විධායක නිළධාරී

## විභාග ඇගයීම හා ප්‍රතිඵල විශ්ලේෂණය

- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
- සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
- සමුපකාර සේවක කොමිෂන් සභාව

## වෘත්තීමය මග පෙන්වීම

TVEC
TVEC Registration No P01/0889

- තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව

## පාඨමාලා මෙහෙයවීම

National Co-operative Council of Sri Lanka

- ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය

**ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය**
இலங்கை தேசிய கூட்டுறவுச் சபை
NATIONAL CO-OPERATIVE COUNCIL OF SRI LANKA

**සමුපකාර සංවර්ධන සහතික පත්‍ර උසස් පෙළ පාඨමාලාව 2021 / 2022 ( මාර්ගගත )**
**( තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාවේ අනුමත පුහුණු පාඨමාලාවකි )**

## ඉල්ලුම් පත්‍රය

01. (අ) මුලකුරු සමඟ නම : ...................................................
මහතා / මහත්මිය / මෙනවිය

(ආ) මුල් අකුරු වලින් කියවෙන නම් : ...................................................
...................................................

(ඇ) සම්පූර්ණ නම ( ඉංග්‍රීසියෙන් ) ...................................................
( ජාතික හැඳුනුම්පතේ සඳහන් පරිදි ...................................................
ඉතා පැහැදිලිව ) ...................................................

02. (අ) රාජකාරි ලිපිනය : ...................................................
: ...................................................

(ආ) රාජකාරි දුරකථන අංකය : ................................ ෆැක්ස් ................................

(ඇ) රාජකාරි ඉ මේල් ලිපිනය : ...................................................

(ඈ) පෞද්ගලික ලිපිනය : ...................................................
: ...................................................

(ඉ) පෞද්ගලික දුරකථන අංකය : ................................ ජංගම ................................

(ඊ) වට්ස්ඇප් දුරකථන අංකය : ................................

(උ) පෞද්ගලික ඉ මේල් ලිපිනය : ...................................................

03. උපන් දිනය : ...................................................

ජාතික හැඳුනුම්පත් අංකය : ...................................................

නිකුත් කල දිනය : ...................................................
(ජායා පිටපත් අමුණන්න)

04. සමුපකාර සේවකයෙක් නම් දරණ තනතුර (සේවා සහතිකය අමුණන්න) : ..............................................................................................

සේවය කරන සමුපකාර සමිතියේ නම සහ ලිපිනය : ..............................................................................................

සේවා කාලය :

| අනු අංකය | සමිතියේ නම | තනතුර | සිට | දක්වා |
|---|---|---|---|---|
| | | | | |

05. සමත්ව ඇති උසස්ම විභාගය (වර්ෂය සමඟ) (සහතික පිටපත් අමුණන්න) : ..............................................................................................

06. විෂයය ප්‍රතිපෝෂණ සම්මන්ත්‍රණ සඳහා සහ විභාගයට සහභාගි විය හැකි පහසුම මධ්‍යස්ථානය :

☐ අනුරාධපුරය ☐ කොළඹ ☐ කුරුණෑගල ☐ ගාල්ල ☐ කහගොල්ල

07. ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

දිනය : 2021 ................................................ ......................................................

අත්සන

08. (සමුපකාර සමිති සේවකයන් සඳහා පමණි)

**සමුපකාර සමිති සහතිකය**

.................................................................................................................................. මයා / මිය/ මෙනවිය

(අයදුම්කරුගේ නම)

අප සමුපකාර සමිතියේ ................................................................................................ දින සිට සේවය කරන අතර, ඉහත පුහුණුව සඳහා ඔහු /ඇය තෝරා ගනු ලැබුවහොත් පුහුණුව සඳහා සහභාගි කරවිය හැකි බව 2021 ............................... දින රැස්වූ ගරු අධ්‍යක්ෂ මණ්ඩලය / කාරක සභාව තීරණය කර ඇත.

.................................................................... ....................................................................

ගරු සභාපති සාමාන්‍යාධිකාරී / ලේකම් (මුද්‍රාව සමඟ)

දිනය : 2021 / ................ / ................

---

**කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා :-**

ලැබුණු මුදල : රු. ......................................................

කුවිතාන්සි අංකය : .............................................................. දිනය : ...............................................